විදුලි පණිවුඩ : "විශ්‍රාම වැටුප්" කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : "PENSIONS" Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මගේ අංකය / எனது இல. / My No.: විවැ/චක්‍රලේඛ/2007

ඔබේ අංකය / உமது இல. / Your No.:

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date: 18.01.2007

_විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2007_

සියලුම දිසාපතිවරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන්
(උතුරු නැගෙනහිර)
බැංකු කළමනාකරුවන්.

**රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා**
**<u>ක්‍රියාත්මක කිරීම - (උතුරු නැගෙනහිර)</u>**

මාගේ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/2006 ට වැඩිමනත් වශයෙනි.

02. උතුරු නැගෙනහිර පළාත් පාලන විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරන්නේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පළාත් පාලන විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය මගිනි. එම දිස්ත්‍රික්කවල සිටින විශ්‍රාමිකයින්ට හා වැන්දඹු විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් කුවිතාන්සි හා චෙක්පත් නිකුත් කිරීම පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය මගින් සිදුවේ.

03. උතුරු නැගෙනහිරට ලියුම් යැවීමේ ප්‍රමාදය නිසා චෙක්පත් හා කුවිතාන්සි විශ්‍රාමිකයින්ට ලැබීම ප්‍රමාද වේ. එමෙන්ම අනෙකුත් දිස්ත්‍රික්කයන්හි විශ්‍රාමිකයින් සඳහා කුවිතාන්සි නොයවන බැවින්, ඉදිරියේ උතරු නැගෙනහිර විශ්‍රාමිකයින් සඳහාද කුවිතාන්සි යැවීම අත්හිටුවනු ලැබේ.

04. එම විශ්‍රාමිකයින් සඳහා ගෙවීම් සිදුකිරීමට චෙක්පත් අදාළ බැංකුව වෙත එවන අතර, ඔවුන්ගේ බැංකු ගිණුම්වලට සෘජුව බැර කිරීමට කටයුතු කරන්න. මගේ 10/2006 චක්‍රලේඛයේ 1 ඡේදයේ බැංකු ආයතනයේ කාර්ය්‍ය භාරය අනුව කටයුතු කරන මෙන් දන්වමි.

05 බැංකු වෙත පළාත් පාලන විශ්‍රාම වැටුප් ගෙවීමට චෙක්පත් හා (Payout Schedule) එවනු ලබන්නේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පළාත් පාලන විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය මගින් බැවින්, ඉහත චක්‍රලේඛන 1,2 අනුව එවන වාර්තා මෙම දෙපාර්තමේන්තුවේ පළාත් පාලන විශ්‍රාම වැටුප් අංශය වෙත යොමුකල යුතුවේ. පළාත් පාලන විශ්‍රාම වැටුප් හැරුණුවිට අනෙකුත් විශ්‍රාම වැටුප් ගෙවීමේදීද විශ්‍රාම වැටුප් කුවිතාන්සි යැවීමකින් තොරව කටයුතු කිරීම යෝග්‍ය වේ. එබැවින් විශ්‍රාම වැටුප් 10/2006 චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කලහැකි අතර බැංකු හා තැපැල් කාර්යාලවල වෙත මුදල් නිදහස් කිරීම පෙර පරිදිම දිසාපතිවරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කල යුතු බව කාරුණිකව දන්වමි.

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්: 1 ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2 ලේකම්, මුදල් අමාත්‍යාංශය.
3 විගණකාධිපති.